www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: වැටුප් වැඩිවීම් ඉල්ලු වතු කම්කරුවන් රැකියාවලින් නෙරපේ

## Sri Lankan plantation workers sacked for demanding wage rise

**එම්. දේවරාජා විසිනි**
**2015 දෙසැම්බර් 1**

දික්ඔය ඉන්ජෙස්ට්‍රී වතු කලමනාකරනය පසු ගිය මාසයේ ව්‍යාජ චෝදනා මත දොට්ට දමන ලද කම්කරුවන් නැවත සේවයේ පිහිටුවීම ප්‍රතික්ෂේප කර ඇත. නොවැම්බර් 19දා වත්තේ කලමනාකරුවන් ලංකා කම්කරු කොංග්‍රස් (සීඩබ්ලිව්සී) නායකයින්ට පවසා තිබුනේ, කැලනි වැලි වතු සමාගෙමේ හිමිකරුවන් වෙත 30දා කොලඹ දී පමනක් කම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කල හැකි බව යි.

ගෝලීය වශයෙන් තේ මිල ගනන් හා ඉල්ලුම පහත වැටීමේ බර ඔවුන් මත පැටවීමේ දී කම්කරුවන්ගෙන් එල්ල වන විරෝධය මැඩපැවත්වීමට වතු සමාගම් කුරිරු ලෙස උත්සාහ දරමින් සිටින්නේ කෙසේ ද යන්න පිලිබඳ ඉන්ජෙස්ට්‍රී වතු කම්කරුවන්ට එරෙහි ප්‍රහාරය පැහදිලි නිදසුනකි.

ඉන්ජෙස්ට්‍රී වත්තේ කොටස් හයක ආසන්න වශයෙන් කම්කරුවන් 1,500ක්, 7 දෙනෙක් දොට්ට දැමීමට එරෙහිව නොවැම්බර් 13වැනිදා දෙදින වැඩ වර්ජනයක් ඇරඹීම හා වාඩිලාගැනීමේ විරෝධතාවක් සංවිධානය කිරීම නො තකා කලමනාකරනයේ තීරනය ගනු ලැබින. කම්කරුවන් බිය වැද්දීමට කලමනාකරනය, නෝවුඩ් හා හැටන් පොලිස් ස්ථානවලින් පොලීසිය ද වත්තට කැඳවී ය.

දඬුවමට ලක් වූ කම්කරුවන් නැවත සේවයේ පිහිටුවීමට කලමනාකරනය සමග ගිවිසුමකට එලඹිය හැකි බව කියා සිටිමින් සීඩබ්ලිව්සී දික්ඔය ප්‍රාදේශීය නායක තන්ගරාජා කිෂෝර්, කම්කරුවන් වැඩවර්ජනය කිරීම හෙලාදුටු අතර එය අත්හිටුවීමට ඔවුන්ට බල කලේය. දොට්ට දැමූ කම්කරුවන් ආරක්ෂා කිරීමේ අරගලය කඩාකප්පල් කිරීමෙන් පසු සීඩබ්ලිව්සීය කම්කරුවන්ට පැවසුවේ, හාම්පුතුන්ගේ අනුකම්පාව මත විශ්වාසය තබන ලෙස ය.

ඉන්ජෙස්ට්‍රී වත්තේ කම්කරුවන් වැඩිදෙනා සීබඩ්ලිව්සී සාමාජිකයින් වන අතර ජාතික කම්කරු කොන්ග්‍රසය (එන්යූඑම්) හා කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) ද වත්ත තුල ක්‍රියාත්මක වේ.

ගනේෂන් සිවකුමාර්, ගනේෂන් පුෂ්පනාදන්, මාරිමුත්තු යෝගේන්ද්‍රන්, ගෝවින්දන් ලෙචුමානන්, සන්ගිලිමුත්තු සන්ගරන්, සිවසාමි මහේන්ද්‍රන් හා පෙරුමාල් මුරගන් දඬුවමට ලක් වූ කම්කරුවන් ය.

ඉන්ජෙස්ට්‍රී වත්තේ කම්කරුවන් දඩයම් කිරීම ඇරඹුනේ ජූලි මාසයේ දී ය. දීමනා ද ඇතුලු රු.1,000ක දෛනික වැටුපක් ඉල්ලා වතුකරය තුල සීඩබ්ලිව්සී කැඳ වූ සිමිත හෙමින් වැඩ කිරීමේ උද්ඝෝෂනයට ඔවුහු සහභාගී වූහ. වැවිලිකරුවන්ගේ සංවිධානය ඉල්ලීම ප්‍රතික්ෂේප කල නමුත්, අගෝස්තු පාර්ලිමේන්තු මැතිවරනය කඩතුරාවක් ලෙස පාවිච්චි කරමින් සීඩබ්ලිව්සීය එම වර්ජනය නැවත් වූයේ, උද්ඝෝෂනය පසුව නැවත ආරම්භ කිරීමට පොරොන්දු දෙමිනි.

ඉන්ජෙස්ට්‍රී කම්කරුවන් හෙමින් වැඩ කිරීමේ උද්ඝෝෂනය ඉදිරියට ගෙන ගිය අතර, කලමනාකරනය ප්‍රකෝපකාරී ලෙස ඔවුන් නෙලූ දලු බාර ගැනීම ප්‍රතික්ෂේප කලේ ය. කම්කරුවන් කලමනාකරුගේ බංගලාව අසල නෙලු දලු තොග ගොඩ ගැසූ විට, වතු කලමනාකරුවෙකුට තර්ජනය කර ඔහුගේ බංගලාවේ ගෙවත්තට හානි කලේ යැයි ව්‍යාජ චෝදනා ඔවුන්ට එල්ල කරන ලදී.

හෙමිහිට වැඩ කිරීමේ ව්‍යාපාරයේ පෙරමුනේ වූ කම්කරුවන් හත්දෙනා, ජූලි 20වැනිදා අත්අඩංගුවට ගැනුනු අතර සතියක් රිමාන්ඩ් භාරයේ තැබින. අවසානයේ දී හැටන් මහේස්ත්‍රාත් උසාවියේ දී, එක් අයෙකුට රු.100,000ක පුද්ගල ඇප මත ඔවුන් මුදා හරින ලදී. ඔවුන්ගේ චෝදනා පිලිබඳ ඊ ලඟ නඩු දිනය මාර්තු 28වැනි දිනට නියම කෙරුනි.

ඇප දීමෙන් පසුව කලමනාකරනය, කම්කරුවන් හත්දෙනාගේ වැඩ තහනම් කර ඊනියා අභ්‍යන්තර පරීක්ෂනයක් ආරම්භ කලේ ය. සිය සහෝදරයින් ආරක්ෂා කරමින් හා ගොතන ලද චෝදනා හෙලිදරව් කරමින් කම්කරුවන් 60දෙනෙකුට වඩා සාක්ෂි දුන් නමුත් කලමනාකරනය නොවැම්බර් 6වැනිදා හිතුවක්කාරී ලෙස කම්කරුවන් දොට්ට දැමී ය.

කම්කරුවන්ට එරෙහිව වැවිලි සමාගම්, මර්දනකාරී ක්‍රමවේද යොදා ගැනීමේ නව හැරීමක් මෙම දඩයමෙන් සලකුනු කෙරේ. මෙම වසර මුල ද එවැනි සිදුවීමක් ඇති විය. මස්කෙලිය වැවිලි සමාගමට අයත් ග්ලෙනුගී වත්තේ ඩීසයිඩ් කොටසේ කම්කරුවන් පෙබරවාරියේදී වැඩ ප්‍රමානය වැඩි කිරීමට එරෙහිව වැඩවර්ජනයකට අවතීර්න වූ විට කලමනාකරනය, ප්‍රකෝපකරනයක් ඇවිල වූ අතර ක්ෂේත්‍ර පරීක්ෂකයෙකුට කායිකව පහරදීමේ බොරු චෝදනා මත කම්කරුවන් අටදෙනෙකු අත්අඩංගුවට ගන්නා ලදී.

මහේස්ත්‍රාත්වරයෙකු කම්කරුවන් අටදෙනෙකුට ඇප ලබා දීමෙන් පසු කලමනාකරනය, තමන්ගේම පරීක්ෂනයක් අරඹා කම්කරුවන් තිදෙනෙකු දොට්ට දැමූ අතර හතර දෙනෙකුගේ වැඩ තහනම් කලේ ය. දොට්ට දමන ලද කම්කරුවන් නැවත සේවයේ පිහිටුවන ලද්දේ ඔවුන් නො කල වැරදි සඳහා සමාව ගැනීමට එන්යූඑම් නායකයින් කම්කරුවන්ට බල කිරීමෙන් අනතුරුව ය.

මාර්තු මාසයේ දී සාමූහික ගිවිසුම අවසන් වීමට නියමිතව ඇතත්, අපනයනය කඩවැටීමකට මුහුන දෙමින් සිටින වැවිලි සමාගම්, වටුප් වැඩි කිරීම ප්‍රතික්ෂේප කර ඇත. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ ආන්ඩුව හා වෘත්තීය සමිතිවල සහාය ඇතිව සමාගම්, කම්කරුවන්ගෙන් වැඩි වැඩ ප්‍රමානයක් ලබා ගැනීමේ නොයෙකුත් ක්‍රම පිලිබඳව සොයා බලමින් සිටිති.

ප්‍රධාන වෙලඳපොලවල, විශේෂයෙන් ම මැදපෙරදිග හා රුසියාවේ, ශ්‍රී ලංකා තේ අපනයනය හා මිල ගනන් වැටී ඇත. 2015 ඔක්තෝබර් වන විට සමස්ත තේ අපනයන ආදායම, රුපියල් බිලියන 16.8 දක්වා, ඊට පෙර වසරේ පැවති ආදායමට වඩා රුපියල් මිලියන 700කින් පහත වැටුනි. ඉරාකය හා සිරියාව තුල ඇමරිකාවේ මූලිකත්වයෙන් සිදුවන මිලිටරි මැදිහත්වීම්, මැද පෙරදිග අපනයන පහත හෙලා ඇති අතර රුසියාවේ ඉල්ලුම අඩු වී ඇත්තේ ඇමරිකාව හා එහි සහචරයන් පටවා ඇති වෙලඳ සම්බාධක හේතුවෙනි.

කම්කරුවන් මුලා කිරීම පිලිබඳව එකිනෙකාට චෝදනා කර ගනිමින් වෘත්තීය සමිති නායකයෝ, සමාගම් හා ආන්ඩුව සමග තිරය පිටුපස වැඩ කරන අතර කම්කරුවන්ට එරෙහි ප්‍රහාරයට සහාය දෙති.

සීඩබ්ලිව්සී නායක ආරුමුගම් තොන්ඩමන් ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවේ ඇමතියෙකු විය. ඔහුගේ වෘත්තීය සමිතිය හෙමින් වැඩ කිරීමේ උද්සෝෂනය කැඳෙව්වේ වැටෙන මූර්ත වැටුපට හා පිරිහෙන ජීවන හා සමාජ තත්වයන්ට එරෙහිව කම්කරුවන් අතර වැඩෙන විරුද්ධත්වය අවමංගත කිරීමට ය. එතැන් සිට තොන්ඩමන් රුපියල් 1,000 දෛනික වැටුප් ඉල්ලීම පවා අතහැර දැමී ය.

අයතාර්ථවත් ඉල්ලීමක් පෙරටුකොට ගෙන ඇතැයි කියමින් අනෙකුත් වෘත්තිය සමිති තොන්ඩමන් හෙලා දකියි.

එන්යූඩබ්ලිව්, යූපීඑෆ් හා තවත් වැවැලි වෘත්තීය සමිතියක් වන ප්‍රජාතන්ත්‍රවාදී මහජන පෙරමුනේ නායකයින් වන, පිලිවෙලින් පී. දිගම්බරම්, වී. රාධක්‍රිෂ්නා හා මනෝ ගනේෂන් වර්තමාන ආන්ඩුවේ ඇමතිවරුන් වෙති. අගෝස්තු මැතිවරනයෙන් පසු වැටුප් වැඩිකර දෙන බවට පොරොන්දු වූ ඔවුහු, පසුව ඕනෑවට වැඩියෙන් ඉල්ලීම නිසා තොන්ඩමන් හෙලා දකිති.

මේ අයුරින් වෘත්තීය සමිති මුලුමනින්ම වැවිලි සමාගම්වල පැත්ත ගෙන ඇති අතර සිය පිරිහෙන ජීවන හා සමාජ තත්වයන්ට එරෙහිව අභියෝග කිරීමට උත්සාහ ගන්නා කම්කරුවන්ට විරුද්ධව කාර්මික පොලීසියක් ලෙස වැඩ කරමින් සිටී.

දඩයමට ලක් වූනු කම්කරුවෙකු වන ගෝවින්දන් ලෙචුමානන් ලෝසවෙඅ මෙසේ පැවසී යඃ ,වතුකරයේ භයානක තත්වයක් වර්ධනය වෙන අතර සමාගම් මුරන්ඩු ලෙස අපගේ පඩි වැඩිකිරීමට විරුද්ධ වෙනවා. වෘත්තීය සමිති පඩි වැඩිවීම් ගැන කතා කරන්නේ නෑ. කොම්පැනිය අපට පහර දෙන්න පටන් ගත්තේ අපි පඩි වැඩි කරන ලෙසත් වැඩි වැඩ එපා කියලත් උද්සෝෂනය කරපු නිසයි.

“අපගේ වැඩ තහනම පටන්ගත් දින ඉඳන් දිනපතා කිලෝග්‍රෑම් 18ක දළු කඩන්න බැරි අයට දින බාගෙක පඩිය දෙන්න කොම්පැනිය පටන් අරන් තියෙනවා. ගිය මාසෙ කිලෝග්‍රෑම් 14ට අඩුවෙන් කඩපු කම්කරුවන්ට ගෙවල තියෙන්නේ දවසේ පඩියෙන් බාගයයි.

“මුලින් ඉරිදා දිනක වැඩ කලොත් කොම්පැනිය අපට දවස් එක හමාරක පඩිය ගෙවන්න බැඳිල හිටියා. දැන් පාලකයෝ ඒක නවත්වලා යන්තම් දවසේ පඩිය විතරක් දෙන්න පටන් අරන් තියෙනවා.”

ඉංජෙස්ට්‍රී වතු කම්කරුවන් දඩයම ගැන වාර්තා නොකිරීම සම්බන්ධයෙන් ලෙචුමානන් මාධ්‍ය හෙලා දුටුවේ ය. “තමන් අත්අඩංගුවට ගැනීම පිලිබඳ ලෝසවෙඅ වාර්තාව අනෙකුත් මාධ්‍යයන්ට පෙන්නුවත් ඔවුන් එය ගනන් ගත්තේ නෑ, කියා ඔහු පැවසුවේ ය.

දඩයමට ලක් වුනු තවත් කම්කරුවෙකු වන මාරිමුත්තු යොහේන්ද්‍රන් මෙසේ අදහස් දැක් වී යඃ “කොම්පැනිය අපගේ රක්ෂා නැවත්වූවාට පස්සේ අපි ඇමති දිගම්බරම්ට යි, යූපීඑෆ් නායකය වී. රාධක්‍රිස්නන්ට යි කිව්වා. ඒ ගොල්ල පොරොන්දු වුනා වත්තට ඇවිත් අපි මූන ගැහෙන්න. හැබැ යි ආවේ නෑ. බොගවන්තලාවෙන් වාර්තාකාරයෙක් ආවා, ඒත් අපි දන්නවා එයාට මේ ගැන වාර්තා කරන්න එපා කියල බලපෑම් ආපු බව. කම්කරුවන් දඩයම් කිරීම වාර්තා නොකිරීම සම්බන්ධයෙන් යෝහේන්ද්‍රන් දෙමල භාෂා විද්‍යුත් මාධ්‍ය හෙලා දුටුවේ ය.”

සංගිලිමුත්තු සන්ගරන්ගේ මව වන 74 වියැති එස්. සිලම්පායී ඇගේ පුතා දොට්ට දැමීම නිසා ඇතිව තිබෙන දුෂ්කරතා පැහැදිලි කලා යඃ “මගේ මුනුපුරු මිනිපිරියන් බලා ගන්න මට වත්තේ අනියම් වැඩ කරන්න වුනා, යි ඇය පැවසුවා ය. මගේ පුතාට රක්ෂාව නැති උනා, මගේ ලේලි අසනීපෙන්, ඒ නිසා වැඩට යන්න බෑ. මගේ මනුස්සය අවුරුදු 84යි, තවමත් වැඩ කරනවා, හරකුන්ට වල් කපනවා කීයක් හරි හොයා ගන්න අපේ ජීවිත බේරාගන්න. අපි ජීවත් වන්නේ අපගේ ජීවිත හරියට උකස් කරලා වගේ. වතු පලකයො අපට මිනිස්සුන්ට වගේ සලකන්නේ නෑ.”

© www.wsws.org